2016.06.22. පිටු. 15

# මැයි මාසයේ වාර්ෂික උද්ධමනය 5.3% ක්

## - අප්‍රේල් මාසය හා සැසඳීමේදී සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරයි

**ජනනී උඩබැද්දාව**

2016 මැයි මාසය සඳහා වාර්ෂික උද්ධමනය 5.3% ක් ලෙස ගණනය කර ඇති අතර, අප්‍රේල් මාසයේ වාර්තා වූ 4.3% ක උද්ධමනය සමග සැසඳීමේදී මැයි මාසයේ උද්ධමනය සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කර තිබේ.

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිවේදනය කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2016 මැයි මාසය සඳහා වන වාර්ෂික උද්ධමනය 5.3% ක් ලෙස ගණනය කොට ඇති බව පවසා සිටියේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) 2015 ඔක්තෝබර් මස සිට අදාළ ලිත් මාසය අවසන් වී 21 වැනි දින ප්‍රකාශයට පත් කරනු ලබයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 මැයි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 113.7 ලෙස ගණනය කර ඇත. මැයි මාසයේ දර්ශකය අප්‍රේල් මාසයේ දර්ශකය (111.6) හා සංසන්දනය කළ විට 2.1ක දර්ශකාංක වැඩිවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.9ක වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.91% කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.97% කින් වැඩිවීම බලපා ඇත.

2016 අප්‍රේල් මාසය හා සසඳන විට 2016 මැයි මාසය සඳහා ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.91% ක වැඩිවීමක් දක්නට ඇත. මෙම වැඩිවීම සඳහා එළවළු, සහල්, දෙහි, අර්තාපල්, මයිසූර් පරිප්පු, රතුළූනු, අමු මිරිස්, කුකුල් මස්, සීනි, සුදුළූනු සහ කරවල යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇති බවත්, එසේ වුවද, බිත්තර, පැපොල්, කෙසෙල්, අඹ සහ පොල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇති බවත් පෙන්වා දෙයි.

2016 අප්‍රේල් මාසය හා සසඳන විට 2016 මැයි මාසය සඳහා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.97% ක වැඩිවීමක් දක්නට ඇත. මෙම ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විවිධ භාණ්ඩ හා සේවා', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇති බව කියයි. තවද, 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇති අතර, එසේ වුවද, 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවී ඇති බවද පෙන්වා දෙයි. එමෙන්ම, 'ප්‍රවාහන' සහ අධ්‍යාපන' කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණු බවද එම දෙපාර්තමේන්තුව වැඩිදුරටත් පෙන්වා දෙයි.




DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO